09 OCT 2018

# එක්සත් වාමාංශික පෙරමුණේ ව්‍යවස්ථාව

01

# එක්සත් වාමාංශික පෙරමුණ

01. නාමය:- එක්සත් වාමාංශික පෙරමුණ

02. අරමුණ සහ පරමාර්ථ:-

(අ) ශ්‍රී ලංකාව තුළ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගීම සඳහා විශේෂයෙන්ම වැඩකරන ජනතාව සහ සමාජයේ අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී කොටස් ද සංවිධානය කිරීම එක්සත් වාමාංශික පෙරමුණේ ප්‍රධාන අරමුණ වේ.

මෙම ව්‍යවස්ථාවෙහි මින් මතුවට "පක්‍ෂය" ලෙස එක්සත් වාමාංශික පෙරමුණ හඳුන්වනු ලැබේ.

(ආ) පක්‍ෂයේ අරමුණ ඉෂ්ඨ කරගැනීම සඳහා වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික බලවේග සමඟ එක්ව පක්‍ෂය කටයුතු කරයි.

(ඇ) ශ්‍රී ලංකාවේ පැවැත්වෙන සියලු මැතිවරණ තරඟ කිරීම සඳහා පක්‍ෂය සංවිධාන වේ.

පක්‍ෂයේ අරමුණු සහ පරමාර්ථ වෙනස් කළ හැක්කේ පක්‍ෂයේ සම්මේලනයකදී මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් පමණි.

03. සාමාජිකත්වයේ කොන්දේසි:-

පක්‍ෂයට ඇතුළත්වන විට හා ඉන් පසුවත් සියළුම පාක්‍ෂිකයින් විසින් මෙම කොන්දේසි සියල්ලම පිළිපැදිය යුතුවේ.

i. පක්‍ෂයේ ක්‍රියා මාර්ගය පිළිගැනීම.

ii. පක්ෂයේ පක්ෂ ශාඛාවක ක්‍රියාකාරි සාමාජිකයෙකු ලෙස පක්ෂයේ වැඩකටයුතුවලට මධ්‍යම කාරක සභාව පිළිගත හැකි ප්‍රමාණයකට සහභාගිවීම.

iii. පක්ෂයේ අරමුදල සඳහා මාස්පතා සාමාජික මුදලක් ගෙවීම. එම සමාජික මුදල කොතරම් විය යුතුද යන්න මධ්‍යම කාරක සභාව විසින් තිරණය කරනු ලැබේ.

04. පක්ෂයට සාමාජිකයින් ඇතුළත් කරවීමේ සම්පූර්ණ බලය ඇත්තේ මධ්‍යම කාරක සභාවට පමණි.

05. **සාමාජිකත්වයේ කොන්දේසි ක්‍රියාවේ යෙදවීම:-**

(අ) පක්ෂයේ ක්‍රියාමාර්ගය පිළිගැනීම සම්බන්ධ වූ 3 (i) වගන්තිය, යම් සාමාජිකයකු විසින් විනය උල්ලංඝනය කළ බවට පරීක්ෂණයේ දී වැරදිකරු වුවහොත් දේශපාලන මණ්ඩලයේ නිර්දේශය මත මධ්‍යම කාරක සභාවට ඔහු විහාම පක්ෂයෙන් නෙරපීමට හෝ නිශ්චිත කාලයකට පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට හැකිය.

විනය පරීක්ෂණය පැවැත්විය යුත්තේ මධ්‍යම කාරක සභිකයන් නොවන පක්ෂ සාමාජිකින් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මගිනි. එම කමිටුව මධ්‍යම කාරක සභාව විසින් පත්කල යුතුය.

(ආ) විනය පරීක්ෂණයක් පැවැත්වෙන කාලය අතරතුර සාමාජිකයකුගේ පාක්ෂිකත්වය දේශපාලන මණ්ඩලයේ නිර්දේශය මත තහනම් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

06. **පක්ෂයේ මූලික සංවිධාන:-**

(අ) පක්ෂ මූලික සංවිධානය පක්ෂ ශාඛාවයි.

(ආ) පක්ෂයේ සෑම සාමාජිකයකුම, මධ්‍යම කාරක සභාව වෙන නියමයන් නො කරන්නේ නම් මිස පක්ෂ ශාඛාවක සාමාජිකයෙකු විය යුතුයි.

07. පක්ෂ ශාඛාව :-

(අ) මධ්‍යම කාරක සභාවේ තීරණය අනුව පක්ෂ ශාඛා පිහිටුවනු ලබයි.

(ආ) යටත් පිරිසෙයින් සාමාජියින් තුන්දෙනෙකුගෙන් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් පක්ෂ ශාඛාවක් සංයුක්ත විය යුතුය.

(ඇ) පක්ෂ ශාඛාවලට අයත් කටයුතු, කලින් කලට මධ්‍යම කාරක සභාව හෝ දිස්ත්‍රික් මණ්ඩලය විසින් හෝ නියම කරනු ලැබේ.

(ඈ) අඩු ගණනේ දෙමසකට වරක් පක්ෂ ශාඛා රැස්වීමක් පැවැත් විය යුතුය. එම රැස්වීම් වලදී තම සමාජිකයන්ගේ වැඩ කටයුතු සොයා බැලීමද මධ්‍යම කාරක සභාව හෝ දිස්ත්‍රික් මණ්ඩලය මගින් නිකුත් කරන ලද දැන්වීම් සලකා බැලීමද කළ යුතුය.

(ඉ) හැම පක්ෂ ශාඛාවම ලේකම් කෙනෙකු තෝරා පත් කළයුතුය.

08. දිස්ත්‍රික් මණ්ඩලය :-

මධ්‍යම කාරක සභාව විසින් රටේ විවිධ ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් මණ්ඩල පිහිටු විය හැක.

දිස්ත්‍රික් මණ්ඩලය තුළ පිහිටි පක්ෂ ශාඛා වල සමාජිකයින් අඩුම වශයෙන් දෙවසරකට වරක් දිස්ත්‍රික් ලේකම්වරයෙකු, භාණ්ඩාගාරික හා පක්ෂ සාමාජිකයින් වන හත් දෙනෙකුගෙන් යුත් දිස්ත්‍රික් කමිටුවක් පත් කළ යුතුය.

පක්ෂ ශාඛාවල ලේකම්වරු එම කමිටුවට නිල බලයෙන් පත්වෙති.

09. මධ්‍යම කාරක සභාව:-

(අ) පක්ෂයේ සම්මේලන දෙකක් අතරතුර ඇති ඉහළම මණ්ඩලය වන මධ්‍යම කාරක සභාව පක්ෂයේ ක්‍රියා මාර්ගය ව්‍යවස්ථාව සහ සම්මේලන තීරණයන් අනුව

පක්ෂයේ ක්‍රියාමාර්ගයට මග පෙන්වීම ද පක්ෂයේ ක්‍රියා පරිපාටිය නියම කිරීමට ද වග කිව යුතුය.

පක්ෂයේ මුල් මධ්‍යම කාරක සභාව සාමාජිකයන් 21 දෙනෙකුගෙන් යුක්ත විය යුතුය.

(ආ) පක්ෂයේ සම්මේලනයක් මගින් තෝරා පත්කර ගනු ලබන මධ්‍යම කාරක සභාව අඩුම වශයෙන් සාමාජිකයන් 50 දෙනෙකුගෙන් සමන්විත යුතු අතර එහි සාමාජික සංඛ්‍යාව සම්මේලනය විසින් තීරණය කරන පරිදි 75 දක්වා වැඩි විය හැකිය.

මධ්‍යම කාරක සභාවේ ඇතිවන පුරප්පාඩු සඳහා වෙනත් සමාජිකයින් පත්කරගැනීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

මධ්‍යම කාරක සභා රැස්වීම්වලට සහභාගිවීමට දිස්ත්‍රික් කමිටු ලේකම්වරුන්ට අවකාශය ලැබේ.

(ඇ) යම්කිසි අවස්ථාවකදී සාමාජිකයෙක් ඉල්ලා අස්වුවහොත් හෝ මියගිය හොත් හෝ වෙන යම්කිසි කරුණක් නිසා සහභාගි විය නොහැකි නම් හෝ මධ්‍යම කාරක සභාවේ ඇබෑර්තුවක් ඇති වන්නේයයි සලකනු ලැබේ.

(ඈ) සංවිධායක මණ්ඩලය විසින් පිළියෙල කරනු ලබන න්‍යාය පත්‍රයක් අනුව අඩු වශයෙන් හය මසකට වරක් වත් මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය. විශේෂ යෝජනාවක් හෝ ඉල්ලීමක් සාකච්ඡා කිරීමට ද මධ්‍යම කාරක සභාව රැස්විය යුතුය.

(ඉ) මධ්‍යම කාරක සභා රැස්වීම් වලට ගණපූරණය එහි සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට වැඩි විය යුතුය.

(ඊ) පිළිගත හැකි හේතුවක් නොදක්වා එකපිට සභා වාර තුනකට සහභාගි නොවන මධ්‍යම කාරක සභිකයන්, එම තනතුරු වලින් ඉවත් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

10. පක්ෂයේ ලේකම්:-

මධ්‍යම කාරක සභාව තම සාමාජිකයෙකු පක්ෂයේ ලේකම් වශයෙන් පත්කර ගත යුතුය.

11. සෙසු නිලතල:-

පක්ෂයේ සෙසු නිලතල පහත සඳහන් වන අතර ඒ සඳහා පත් කිරීම් මධ්‍යම කාරක සභාව විසින් කළ යුතුය.

i. ජාතික සංවිධායක

ii. භාණ්ඩාගාරික

iii. නියෝජ්‍ය ලේකම්

iv. උප ලේකම්වරු තිදෙනෙකු

v. නියෝජ්‍ය භාණ්ඩාගාරික

12. පක්ෂයේ මුදල් :-

(අ) පක්ෂයේ මුදල් දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකුවක තැන්පත් කළ යුතුය.

(ආ) පක්ෂයේ බැංකු ගිණුම් ලේකම්වරයා සහ ජාතික සංවිධායක යන දෙදෙනාගෙන් එක් අයෙකු සහ භාණ්ඩාගාරිකවරයා විසින් පවත්වාගෙන යා යුතුය.

13. පක්ෂයේ වෙනත් මණ්ඩල :-

පහත සඳහන් මණ්ඩල සහ මධ්‍යම කාරක සභාවට හැගෙන වෙනත් ඕනෑම මණ්ඩලයක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ හැක.

i. දේශපාලක මණ්ඩලය

ii. සංවිධායක මණ්ඩලය

iii. වෘත්තීය සමිති මණ්ඩලය

iv. කතීා මණ්ඩලය

v. අධ්‍යාපන මණ්ඩලය

මෙම මණ්ඩලවල සාමාජිකයින් සංඛ්‍යාව වරින් වර මධ්‍යම කාරක සභාව විසින් නම් කරනු ලබයි.

14. පාක්ෂික සම්මේලනයః-

(අ) පක්ෂයේ ඉහළම මණ්ඩලය, පක්ෂ සාමාජික නියෝජිතයින්ගෙන් සමන්විත පක්ෂ සම්මේලනයයි.

(ආ) එක් එක් පක්ෂ ශාඛාවකින් සම්මේලය සඳහා පත් කෙරෙන නියෝජිත සංඛ්‍යාව මධ්‍යම කාරක සභාව විසින් නියම කළයුතුය.

(ඉ) සම්මේලනයේ තීරණය මුළු පක්ෂය විසින් අනුගමනය කළ යුතු අතර එම තීරණ වෙනස් කළහැක්කේ තවත් පක්ෂ සම්මේලනයක් මඟින් පමණි

15. සම්මේලනයක් අවශ්‍ය වූ විට එය කැඳවීම මධ්‍යමකාරක සභාව සතු කාර්යයකි.

හැකි නම් අඩුම වශයෙන් තුන් වසරකට වරක් සම්මේලනයක් කැඳවීමට මධ්‍යම කාරක සභාව උත්සාහ දැරිය යුතුයි.

පක්ෂ සාමාජිකත්වයෙන් තුනෙන් එකකට (1/3) වැඩි සංඛ්‍යාවක් විසින් ලිඛිත ඉල්ලීමක් කළ විට පක්ෂ සම්මේලනයක් කැඳවීම මධ්‍යම කාරක සභාවේ යුතු කම වේ.

16. අනෙකුත් පක්ෂ සංවිධාන

පහත සඳහන් සංවිධාන පක්ෂයේ මූලිකත්වයෙන් පිහිටුවිය යුතුය.

i. තරුණ සංවිධාන

ii. කාන්තා සංවිධාන

iii. කම්කරු සහ ගොවි සංවිධාන

- පක්ෂයේ ප්‍රධාන බහුජන සංවිධානය "සංවාද කේන්ද්‍රය" නමින් විය යුතුය.

  එහි කටයුතු වරින් වර මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

- අධ්‍යාපන සහ ශාස්ත්‍රීය කටයුතු සඳහා "සමාජවාදී අධ්‍යයන කවය" නමින් සංවිධානයක් පිහිටුවිය යුතු අතර,

  එහි කටයුතු වරින් වර මධ්‍යම කාරක සභාව හෝ දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

17. මැතිවරණ කොට්ඨාස සංවිධායකවරු

මැතිවරණ බල ප්‍රදේශ මට්ටමෙන් හෝ දිස්ත්‍රික් මට්ටමෙන් සංවිධායකවරු පත් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත්තේය.

18. ව්‍යවස්ථා සංශෝධන

මෙම ව්‍යවස්ථාව හෝ ව්‍යවස්ථාවේ ඕනෑම කොටසක් පක්ෂ සම්මේලනයකදී වෙනස් කළ හැකි අතර ඒ සඳහා ඇති යෝජනා පිළිබඳ පූර්ව දැනුම් දීමක් සම්මේලනයට සහභාගිවන නියෝජිතයන් වෙත කළ යුතුය.

19. භාරකාර මණ්ඩලය :-

- සම්මේලනයේ පසුව රැස්වන පළමු දේශපාලන මණ්ඩල රැස්වීමේදී පක්ෂයේ චංචල හා නිශ්චල දේපළවල භාරකාරිත්වය සඳහා දේශපාලන මණ්ඩලයේ තෝරාගත් තිදෙනෙකු සහ ප්‍රධාන ලේකම් සහ භාණ්ඩාගාරික නිළබලයෙන් ඇතුළත්වන පරිදි 5 දෙනෙකුගෙන් යුතු භාරකාර මණ්ඩලයක් ඇති කළ යුතුය.

(ආ) පක්‍ෂයේ සියලු චංචල සහ නිශ්චල දේපල සංවර්ධනය කිරීම, වැඩි දියුණු කිරීම ආදි කරුණු භාරකාර මණ්ඩලයට අයත් වේ. යම් ගිවිසුම් ඇති කර ගැනීමේ බලය භාරකාර මණ්ඩලයේ උපදෙස් මත දේශපාලන මණ්ඩලයේ අනුමැතියට යටත්ව, ප්‍රධාන ලේකම්වරයාට සහ භාණ්ඩාගාරිකවරයාට බලය හිමිවේ.